# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2015

## Primary Piriven Mid Year Term Test - 2015

3 වසර / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ත්‍රිපිටක ධර්මය**
**Tripitaka Dharmaya**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06 කට පිළිතුරු ලියන්න.**

## I කොටස

**01. කෙටි පිළිතුරු සපයන්න.**

i. දෙවැදෑරුම් ප්‍රාතිමෝක්ෂ දේශනා නම් කරන්න.

ii. ''දුර අරමුණු වෙත යන, තනිව හැසිරෙන'', සිත පිළිබඳව කියවෙන ගාථාව ලියන්න.

iii. ''වෛරයෙන් වෛරය නොසන්සිඳේ අවෛරයෙන් වෛරය සන්සිඳේ'' මෙම අදහස ඇතුළත් ජාතක කථාව නම් කරන්න.

iv. ලෝභ මූලික සිත් කීය ද?

v. පුනප්පුනං යාචකා යාචයන්ති - පුනප්පුනං දානපතී දදන්ති
පුනප්පුනං දානපති දදිත්වා - පුනප්පුනං සග්ග මුපෙති ඨානං ..... මෙහි අදහස ලියන්න.

vi. සඟමිත් තෙරණිය සමඟ ලක්දිවට වැඩම කළ භික්ෂුණීන් වහන්සේලාගෙන් පස් නමක් නම් කරන්න.

vii. ''න බාහුප්ප චාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා'' යන්නෙහි තේරුම ලියන්න.

viii. සොළොස් මහජන පදවල එන සමූහාණ්ඩු 02 ක් නම් කරන්න

ix. සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

x. තච පංචකය නම් කරන්න. (ලකුණු 40)

## II කොටස

02. i. අසදෘශ මහා දානය විස්තර කරන්න.

ii. මින් දෙදෙනෙකු හඳුන්වන්න.

1) ඡත්ත මානවකයා 2) කුමාර කස්සප මාතාව 3) මට්ටකුණ්ඩලී

(ලකුණු 6+6 =12)

03 i. දුන්නිග්ගහස්ස ලහුනො ........
යථාපි භමරො පුපඵං .................. යන ගාථා දෙක සම්පූර්ණ කරන්න.

ii. ඉන් එක් ගාථාවක තේරුම ලියන්න (ලකුණු 6+6 =12)

04 i. මාතික මාතා කථා පුවත කෙටියෙන් ලියන්න.

ii. මෙම මාතාවගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ලියන්න.

(ලකුණු 8+4 =12)

05 i. දීඝීති කෝසල ජාතක කථාව සැකෙවින් ලියන්න.

ii. ''දීඝං පස්ස මා රස්සං'' යන කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 8+4 =12)

06 i. අහේතුක ක්‍රියා සිත් නම් කරන්න.

ii. ''සත්තාකුසල පාකානි'' යන ගාථාව සම්පූර්ණ කර අර්ථය ලියන්න.

(ලකුණු 4+8 =12)

07 i. උදය සූත්‍රයේ එන බුදුරදුන් හා උදය බමුණා අතර ඇතිවූ සංවාදය ඔබේ බසින් ලියන්න.

*නැතහොත්*

ii. උදය හා ආදිත්ත සූත්‍රයට අනුව දානානිසංස ධර්ම දේශනාවක් පිළියෙල කරන්න.

(ලකුණු 12)

08 i. මහින්දාගමනයෙන් අපට ලැබුණු දායාද හතරක් නම් කරන්න.

ii. ''විහාර මහා දේවිය ජාතිය වෙනුවෙන් කැප වූ වීර මාතාවකි.'' පැහැදිලි කරන්න.

(ලකුණු 4+8 =12)

09 i. අරිය සච්ච යන වචනය පැහැදිලි කරන්න.

ii. දුක පිළිබඳ සඳහන් වන ආකාර දොළොසින් හයක් නම් කරන්න.

(ලකුණු 6+6 =12)

The National e-learning Portal for The General Education